GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

24-09-2013

## මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමත් සමග වෛද්‍ය සේවාවන් වඩාත් දියුණු වී ඇත. අතීතයේ එකම වෛද්‍යවරයෙකුට වැඩිහිටියන්ට ප්‍රතිකාර කිරීම, දරුවන්ට ප්‍රතිකාර කිරීම, මාතෘ සායන ආදි සියල්ලම කරන්නට සිදු විය. නමුත් දැන් රෝහල් තුල වෛද්‍යවරු විශේෂිත ඒකක වල වැඩ කිරීමත් පශ්චාත් උපාධි හැදෑරීම් සඳහා යොමු වීමත් නිසා සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි වී ඇත.

ශ්‍රී ලංකාවේ විධායක ශ්‍රේණියේ වෘත්තියවේදින් අතරින් විශාල ප්‍රමාණයක් රජයේ සේවයේ යෙදෙන්නේ වෛද්‍ය වෘත්තියවේදින් පමණි. මෙමගින් දියුණු රටවල තත්ත්වයේ ගුණාත්මක නිදහස් වෛද්‍ය සේවයක් ලාංකිය ජනගහනයෙන් විශාල ප්‍රමාණයකට (බාහිර රෝගින් 50% ක් හා ඇතුලත් වු රෝගින් 90%කට) පවත්වාගෙන යාමට රජයට හැකි වී ඇත. නොයෙකුත් රාජ්‍ය සේවාවන් ආවරණය කරමින් සේවා ව්‍යවස්ථාවන් ඇති අතර වෛද්‍ය සේවයේ ඇති මේ සුවිශේෂි ලක්ෂණයන් නිසා වෛද්‍ය සේවා ව්‍යවස්ථාව ප්‍රථම ආවේනික වු මුහුණුවරක් ගනී.

දැනට වෛද්‍යවරුන් II වැනි ශ්‍රේණියට සිට I ශ්‍රේණියට උසස්වීමට වසර 18ක් බලා සිටිය යුතුය. එමෙන්ම දිරිගැන්වීමක් ලෙස පශ්චාත් උපාධි හැදෑරීම් කල වෛද්‍යවරුන්ට වසර 10කින් 1 වැනි ශ්‍රේණියට උසස් වීම අනුමත වේ. 02/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේකයට අනුව කිසිඳු රජයේ සෙවකයෙක් තම උසස්විම සඳහා වසර 10 නොයික්ම විය යුතු බව සඳහන් කර ඇත. ඒ අනව වෛද්‍යවරුන්ටද වසර 18 වෙනුවට වසර 10කින් උසස්වීමට හැකියාව ලැබිය යුතුය. ඒ අනුව පශ්චාත් උපාධි හැදෑරූ වෛද්‍යවරුන් වසර 06කින් එම උසස්වීම් ලැබිය යුතුය.

මෙම කරුණු අඩංගු වෛද්‍ය සේවා වාර්තාව ජාතික වැටුප් කොමිසම, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය, මුදල් අමාත්‍යංශය මෙන්ම සොබ්‍ය අමාත්‍යංශයද අනුමත කර ඇත. නමුත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අතිරේක ලේකම්වරිය මෙම උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක කිරීම මාස 06ක් තිස්සේ හිතාමතාම පමා කරමින් සිටියි. ඉන් වෛද්‍යවරුන්ගේ අදාල උසස්වීම් වලට වැටුප් සහ වැටුප් සංශෝධනයන්ට අහිත කර ලෙස බලපා ඇත. එමෙන්ම පශ්චාත් උපාධි හැදෑරීම් කිරිමට වෛද්‍යවරුන් උනන්දු කිරිමේ අවස්ථාවටද අහිතකර ලෙස බලපා ඇත. රටේ වෛද්‍යවරුන් පශ්චාත් උපාධි හැදෑරීම් නොකලවිට ඉන් සමස්ත රෝගි සේවාවම පසුගාමී වනු ඇති අතර මෙය වෛද්‍යවරුන්ගේ මුලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ද වේ.

යුද්ධය නිමා කර සියලු ක්ෂේත්‍ර ගැන දියුණුවක් අපේක්ෂා කරන යුගයක අන්තර්ජාතික මට්ටිමේ පවත්නා සෞඛ්‍ය සේවය බිඳ දැමීමේ ප්‍රයත්නයක යෙදී සිටින අවස්ථාවක් ලෙස සෞඛ්‍ය ඇමතිතුමා වෙත පසුගිය 20 වන දින පැවති සාකච්ඡාවකදී කරුණු අවධාරණය කරන ලදී. එමෙන්ම මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලයේදී සාකච්ජා කරන ලෙස උදක්ම ඉල්ලීමක් කර ඇත.

මෙම ක්‍රියාවලිය යථාවත් කර නිසි පරිදි වෛද්‍යවරුන්ට ශ්‍රේණි උසස්වීම ලබා දීමට කටයුතු සම්පාදනය නොවුන හොත් ඉදිරි සති දෙක තුල ඕනෑම අවස්ථාවක වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට යොමු වීම වැලැක්විය නොහැකි වනු ඇත.

ස්තුතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න - 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516